# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | **බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව** |
| **දිනය** | : | **2014-09-25** |
| **වේලාව** | : | **පෙ.ව. 10.00** |

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | ඒ. අසංක නිල්මිණී විජයසිංහ මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමඃ

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු නාගරික මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මෙහිදි අදහස් දක්වමින් ගරු සභාපතිතුමා විසින් පවසා සිටියේ වසර ගණනාවක් පැවති භීෂණ යුද්ධය නිමාකරමින් අනාගත දරු පරපුරට බියෙන්,සැකෙන් තොරව ජීවත් වීමේ පරිසරයක් අතිගරු

ජනාධිපතිතුමා විසින් නිර්මාණය කරතිබෙන මොහොතක රටේ සියළුම මැතිවරණ නියමිත කාල වකවාණුවලට පවත්වමින් මෙවර පැවති ඌව පළාත් මැතිවරණය ජයග්‍රහණය සඳහා පුරෝගාමීව කටයුතු කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට හා ඌව ජයග්‍රණය කරා ගෙන යමින් රජය වෙත සහාය ලබාදුන් ඌව පළාතේ සියළුම ජනතාවටද බලංගොඩ නගර සභාව වෙනුවෙන් ස්තුතිය පළකිරිමට මෙය අවස්ථාවක් කර ගන්නා බවයි. එමෙන්ම ඌව පළාත් සභාව වෙත තේරි පත්වූ ඇමතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ජනතාවගේ සිතුම්,පැතුම් තේරුම් ගනිමින් ඊට සරිලන ආකාරයේ සේවාවක් සැපයීමට අවශ්‍ය ශක්තිය,ධෛර්යය ලැබේවා යන්නත්,සැලසුම් සහගතව නිමා කල යුද්ධයේ අවසානයත් සමඟ අතිගරු ජනාධිපතිතුමා විසින් ආරම්භ කල සංවර්ධන කාර්යයන් අඛන්ඩව කරගෙන යාමේ ශක්තිය රජයට ලැබේවා යන්නත් එතුළින් ආසියාවේ ආශ්චර්යය කරා රට ගෙන යාමට ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම 2014 වර්ෂයේ අයවැය යෝජනා තුළින් අතිගරු ජනාධිපතිතුමා විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා ලබාදුන් මුදල් ප්‍රතිපාදන තුළින් මේවන විට විශාල කාර්යය භාරයක් නිමා කර ඇති බවත්, මේවන විට 2015 වර්ෂයේ අයවැය සැකසීම සඳහා කඩිනමින් යෝජනා ලබාදුන් බවත්, පෙර වර්ෂයටත් වඩා වැඩි මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් 2015 වර්ෂය සඳහා ලැබේ යැයි අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

මෙවර දැයට කිරුළ මාතර පවත්වනු ලැබුවත් රත්නපුර දිස්ත්‍රික්කයද ඊට සහභාගි කරවා ගෙන ඇති හෙයින්, බලංගොඩ නගර සභාව සඳහා ද ජංගම සේවා පැවැත්වීම සඳහා හට් 10 ක් ලබාදී ඇති බවත් දැයට කිරුළ තුළින් සිදුවන සංවර්ධනයේ ප්‍රතිලාභ නුදුරු අනාගතයේදී බලංගොඩ ජනතාවටද ලැබෙන බවත් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

තව දුරටත් අදහස් දක්වමින්, කාලයක් තිස්සේ නගර සභාවේ පැවති සුළු සේවක ගැටළුවට පිළියමක් වශයෙන් අවම සුදුසුකම් යටතේ සේවකයන් බදවා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටි පළාත් සභාව මගින් සකස් කර ගෙන යන බවත්, ඒ අනුව ඔවුන්ගේ ස්ථිර වීමත් සමඟ සභාව මගින් වැටුප් ගෙවීමට අනවශ්‍ය බැවින් එම මුදල් ප්‍රදේශයේ වෙනත් පොදු කාර්යයන් සඳහා යොදාගත හැකිබැවින් එහි ස්තුතිය මහ ඇමතිතුමා ඇතුළු පළාත් සභාව වෙත පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

එමෙන්ම ඉදිරි වර්ෂයේ දී සභාව විසින් ජනතාවට සේවය කිරීම සඳහා ගන්නා තීන්දු තීරණ ගෙන ඒවා සඵලදායි ලෙස ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය සහය සභාව වෙත ලබාදෙන මෙන් ගරු සභාපතිතුමන් විසින් ඉල්ලා සිටින ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

මෙදින සභාවේදි සමාලෝචන කිසිවක් ඉදිරිපත් නොවන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදි වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ දළ වශයෙන් ලක්ෂ පහලොවක පමන මුදලක් වැය කරමින් කර්මාන්ත 9ක වැඩ අවසන් කර ඇති බවයි.

මෙහිදී කුමාරගම සොහොන් පිට්ටනිය බිම් අයිතිය සම්බන්ධයෙන් චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා නැගූ ප්‍රශ්නයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා බිම් සවිය වැඩසටහන ඔස්සේ නගර සභාවට අයිති සියළු දේපළ පිළිබද වාර්තාවක් ඉදිරි මාස කීපය ඇතුළත පිළියෙල කිරිමට සූදානම් කර ඇති බවත් එමගින් මෙම ගැටළුව සඳහා පිළිතුරු ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම

පසුගිය සභා වාරයන්හිද සාකච්ඡා කල පරිදි උඩ ඇල්ලෙපොල නාන ළිඳ පිළිබඳව නැගූ ප්‍රශ්නයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඒ පිළිබඳව කීප අවස්ථාවක් පරීක්ෂා කිරීමට ගොස් ඇති බවත් ඊට ගම්වාසීන්ගෙන් ලැබෙන සහයෝගය අල්ප බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ පිළිබඳව වාර්තාවක් ඉල්ලා ඇති අතර ඉදිරියේදි මේ සඳහා විසඳුමක් දීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 2015 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැලේ මස්කඩ ටෙන්ඩර් කිරීම.

පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 2009/01 හි උපදෙස් අනුව පොදු වෙළෙඳ සැල අංක 15,16,17 දරන මස් කඩ 2015 වර්ෂය සඳහා බදු දීම කළ යුතු බවද, ටෙන්ඩර් පත් සකස් කිරීමට දැන්වීම සකස් කල යුතු හෙයින් ඊට පෙර වර්ෂය එනම් 2014 වර්ෂය පැවති මිල ගණන් පාදක කර ගෙන අවම ලංසුව සකසා රජයේ නීති රීති හා කොන්දේසිවලට අනුකූලව සිංහල හා දමිල යන භාෂාවලින් දැන්වීම පළකිරීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එහිදී 2014 වර්ෂයේ පිළිගනු ලැබූ මිල ගණන් පහත පරිදි ඉදිරිපත් කරන ලදී.

- පොදුවෙළඳ සැල අංක 15 දරණ එළු මස් කඩය - රු. 6,308.00
- පොදුවෙළඳ සැල අංක 16 දරණ හරක් මස් කඩය - රු.125,075.00
- පොදුවෙළඳ සැල අංක 17 දරණ කුකුල් මස් කඩය - රු. 15,000.00

මෙහිදී ලංසුපත් නිකුත් කිරීම 2014-10-15 දින දක්වා සිදුකිරීමටත් 2014-10-16 දින ලංසුපත් විවෘත කිරිමටත් තීරණය කරන ලදී.

ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර මෙහිදී හරක් මස් කඩ ටෙන්ඩර් කිරීමේ දී තමා ටෙන්ඩර් මණ්ඩලයෙන් ඉවත් වෙන බව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා සභාවට ප්‍රකාශ කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ අතර එය මහ සභාවේ සම්මත විය.

### 06:02 2015 වර්ෂය සඳහා රථවාහන නැවතුම් ගාස්තු අයකිරීම හා ටෙන්ඩර් කිරීම.

2015 වර්ෂය සඳහා බලංගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අය කිරීමට 2015 වර්ෂයේ ජනවාරි 01 සිට 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලයට බදු දීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීමට විවෘත ටෙන්ඩර් කැඳවීමට අවශ්‍යව ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහ සභාව වෙත දැනුම් දෙන ලදී.එහිදී පසුගිය වර්ෂයේ මෙම බදු දීමේදි පිළිගනු ලැබූ මිල ගණන වන රු.87,750 මුදලම අවම ලංසුව සේ සළකා 2015 වර්ෂය සඳහා ටෙන්ඩර් පත් කැඳවීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

මෙහිදී ලංසුපත් නිකුත් කිරීම 2014-10-15 දින දක්වා සිදුකිරීමටත් 2014-10-16 දින ලංසුපත් විවෘත කිරිමටත් තීරණය කරන ලදී. ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:03 2015 වර්ෂය සඳහා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම.

පිරිසිදු කිරීම් කටයුතු සඳහා, ප්‍රමාණවත් අනුමත සේවක සංඛ්‍යාවක් නොමැති හෙයින් බස් නැවතුම්පළ හා මහජන පොළ ආශ්‍රිත ගැහැණු සහ පිරිමි පොදු වැසිකිළි පිරිසිදු කිරීම හා නඩත්තු කිරිම, පෞද්ගලික අංශයට පැවරීම වෙනුවෙන් ,පූජ්‍ය පක්ෂය හා පාසැල් ළමුන්ගෙන් හැර එක් අයෙකුගෙන් රු.5.00 වන සේ ගාස්තු අය කිරීමට පෙර වර්ෂයේ එනම් 2014 වර්ෂයේ පැවති

රු.650,000 අවමය සේ සළකා 2015 වර්ෂය සඳහාද ලංසුපත් කැදවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙහිදී ලංසුපත් නිකුත් කිරීම 2014-10-15 දින දක්වා සිදුකිරීමටත් 2014-10-16 දින ලංසුපත් විවෘත කිරිමටත් තීරණය කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 කසල ඉවත් කිරිම සඳහා 2015 වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් කැදවීම.**

නගර සභාව තුළ දෛනික පිරිසිදු කිරීම හා කසළ එකතු කිරීම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති හෙයින් එම කාර්යයන් පෞද්ගලික ලංසු කරුවෙක් මගින් සපයා ගැනීම සඳහා ටෙන්ඩර් පත් කැදවීමට අවශ්‍ය බවත් ඒ සදහා පෙර වර්ෂයේ එනම් 2014 වර්ෂයේ පැවති පරිදි වාර්ෂික උපරිම ලංසුව රු.2,820,000.00 (විසි අට ලක්ෂ විසි දහසක්) වන සේ 2015 වර්ෂය සඳහාද ලංසුපත් කැදවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙහිදී ලංසුපත් නිකුත් කිරීම 2014-10-15 දින දක්වා සිදුකිරීමටත් 2014-10-16 දින ලංසුපත් විවෘත කිරිමටත් තීරණය කරන ලදී. එම යෝජනාව ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 සී 32 කඩකාමරය පැවරීම - එම්.අයි.එම්.හිල්මි**

එම්.අයි.එම්.හිල්මි යන අයට අයත් සී 32 ඒ දරණ කඩ කාමරයේ හිග කඩ කුළී සියල්ල ගෙවා ඇති බවත් එහි බදු අයිතිය ඒ.එම්.එස්. අලංකාර නමින් වෙනස් කර දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත් බව ගරු සභාපතිතුමන් විසින් සභාවට පවසන ලද අතර ,මාස 6ක තැන්පත් මුදල් හා මාසික කුළිය වන රු.4572 බැගින් මාස 3ක් සඳහා කඩ කුළිය ලබාගෙන කඩයේ බදු අයිතිය පැවරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලීම. ඩබ්.වී. චන්ද්‍රා විජෙකෝන්**

බලංගොඩ, ඕලුගංතොට, රබර් වත්ත පාර අංක 19/32 පදිංචි ඩබ්.වී. චන්ද්‍රා විජේකෝන් යන අය පිළිකා රෝගී තත්වයෙන් හා දරිද්‍රතාවයෙන් පෙළෙන බවත් , ඇය වරිපනම් බද්දෙන් නිදහස් කර දෙන මෙන් ගරු සභාවට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් පැවසූ ගරු සභාපතිතුමා ඇය පත්ව ඇති අසරණ තත්වය සළකා දරිද්‍රතාවය මත වරිපනම් මුදලින් නිදහස් කිරීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:07 සිරි දළදාගමනය චිත්‍රපටිය විනෝද බද්දෙන් නිදහස් කිරීම.**

ර/විද්‍යාලෝක විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මගින් 2014-09-18 දින ප්‍රදර්ශනය කරනු ලැබූ සිරි දළදාගමනය චිත්‍රපටය විනෝද බද්දෙන් නිදහස් කරන මෙන් කර තිබූ ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම මුදල් පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ උන්නතිය සඳහා යොදවන බව පවසා ඇති හෙයින් ඒ පිළිබද සොයා බලා වාර්තාවක් ලබාගෙන අදාළ බදු මුදල්වලින් නිදහස් කරන ලෙසට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 වරිපනම් බදු බිල් නොකිරීම සඳහා තීරණයක් ගැනීම. තේ ශක්ති අරමුදල**

හපුතලේ පාරේ අංක 538/1 ,538 /2 ,538/3,538/4,538/5 දරණ තේ කම්හල, සභාපති,තේ ශක්ති අරමුදල නමින් වරිපනම් බදු ගෙවන බවත්, දැනට ව්‍යාපාර කටයුතු කිසිවක් නොකරන හෙයින් වරිපනම් ගාස්තුවෙන් නිදහස් කරන ලෙස ඉල්ලීම් කරතිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී නැවත ව්‍යාපාර කටයුතු ආරම්භ කරන තෙක් ඉඩම සඳහා පමණක් බදු අයකිරිමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:09 කඩකුළී වැඩි කිරීම සඳහා සභා තීරණයක් ගැනීම.**

අයවැය කමිටු රැස්වීමේදි සියළුම කඩ කුළී කිසියම් ප්‍රමානයකින් වැඩි කිරීමට යෝජනා කර ගත් පරිදි ,කඩ කුළී වැඩි කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛන ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා තක්සේරු වාර්තාවක් ලබාගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:10 හිඟ ආදායම් අය කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම**

හිඟ ආදායම් අය කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 2013 වර්ෂයේ අවසාන ගිණුම සකස් කිරිම පිළිබඳ විගණන මතයක් ගොඩ නැගීම.**

2013 වර්ෂයේ අවසාන ගිණුම නිසි ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව සකස් කිරිම පිළිබඳව විගණන මතයක් ලබා ගැනීම සම්බන්ධයෙන් සභාවේ ප්‍රශංසාව හිමි වෙන බව පැවසූ ගරු සභාපතිතුමා ඒ සඳහා ක්‍රියා කල සියළු දෙනාට සභාවේ ස්තුතිය පිරිනමන බවත්, පෞද්ගලික ලිපිගොනුවලට ප්‍රශංසා සහතික ඇතුලත් කිරීමටත් තීරණය කරන ලදී.

**06:12 2015 වර්ෂය සඳහා සැපයුම් හා කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීම.**

2015 ජනවාරි මස 01 වන දින සිට 2015 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂයක කාලයේදි මෙම සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයා ගැනීමටත් ,සභාවෙන් ලබාදෙනු ලබන කොන්ත්‍රාත් ලබා දීමටත් සුදුසු සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:13 2015 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාවේ ගිවිසුම් අත්සන් කිරීම.**

මහජන පොළ ආපන ශාලාවේ ගිවිසුම් කාලය 2014.12.31 දිනෙන් අවසන් වනබැවින් 2014 වර්ෂයේ ගිවිසුම් කරු සමග නැවත මිල ගණන් සංශෝධනය කිරීමෙන් අනතුරුව 2015 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව තීරණය විය.

**06:14 මහජන පොළ ආපන ශාලාවේ මාසික කුළිය අඩුකර ගැනීම.**

මහජන පොළ ආපන ශාලාවේ මාසික කුළිය රු.10,000 මුදල ගෙවීම දුෂ්කර බවත්, එම මුදල රු.5000 දක්වා අඩුකර දෙන ලෙෂත් කර තිබූ ඉල්ලීම් ලිපිය ,ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

එහිදී මහජන පොළ ආශ්‍රිත සියළු කඩ කාමරවල කුලිය තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බැවින් එම තක්සෙරු මිල ගණන් ලැබුනු පසු ඒ පිළිබඳව තීරණයක් ගැනීමට සභාවේදි සාකච්ඡා කරන ලදී.

**06:15 කිරිඳිගල ජල ටැංකිය අසල ඉඩමේ බදු මුදල නිදහස් කිරීම**

කිරිඳිගල ජල ටැංකිය අසල ඉඩම බදු මුදලින් නිදහස් කිරීම සඳහා ආදායම් පරීක්ෂකතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ,ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී මෙම ඉඩමේ අයිතිය පිළිබඳව සවිස්තර වාර්තාවක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමෙන් අනතුරුව බදු ගිවිසුම සමඟ නැවත සභාවට ඉදිරිපත් කරන ලෙස ,ගරු සභාපතිතුමන් විසින් උපදෙස් දෙන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ හෙයින් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 වරිපනම් බදු සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීම.**

2015 වර්ෂයට වරිපනම් පැනවීමේදි බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව සභා තීරණයක් ගෙන ගැසට් නිවේදනයක් පළ කළ යුතු බව පවසමින් සභාවට ඉදිරිපත් කර තිබූ ලිපිය සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා දැනට පවත්නා අයුරින් එනම්, සෑම ගෘහස්ථ ස්ථානයකින්ම 15% ක්ද,ව්‍යාපාරික ස්ථාන හා ඉඩම්වලින් 20% ක් වශයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටත්, කාර්තු හතරට අදාළ වරිපනම් මුදල් පළමු කාර්තුවේ ජනවාරි 31 වෙනි දිනට පෙර ගෙවූ විට 10% ක කොමිස් මුදලක් හා පළමු කාර්තුව ඇතුළත ගෙවූ විට 5% ක කොමිස් මුදලක් අඩුවන බවත් දන්වමින් ගැසට් නිවේදනයත් පළකරන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 තැපැල් මුද්‍රා යන්ත්‍රයේ මුද්දර මුදල් වැඩිකර ගැනීම.**

තැපැල් මුද්‍රා යන්ත්‍රය සඳහා දැනට මුද්දර ගාස්තු ලෙස ඇතුළත් කරන රු.2000 ක මුදල ප්‍රමාණවත් නොවන බවත් , මෑතක පටන් තැපැල් ගාස්තු වැඩිකර ඇති නිසා හා දිනපතා ලිපි විශාල සංඛ්‍යාවක් තැපැල් කිරීමට සිදුවීම නිසා එම මුදල රු.20,000 දක්වා වැඩි කිරීමට කර තිබූ ඉල්ලීම් ලිපිය සභාව වෙත ඉදිරිපත් කල ගරු සභාපතිතුමා එය රු.10,000 දක්වා වැඩි කිරීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 ගලි බවුසරය සඳහා අය කරන ගාස්තු වැඩිකර ගැනීම.**

ගලි බවුසරයේ සේවා සැපයීමේදි ගාස්තු සංශෝධනය සඳහා වර්තමාන ගාස්තුව රු.1250 කින් වැඩිකිරීමට ඉල්ලීම් කර, ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී මෙම යෝජනාව සභාවේ විවාදයට ලක්කරමින් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා හා ගරු උප සභාපති වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දැක්වූ අතර අවසානයේ රු.1250 මුදල රු.750 ලෙස අඩුකිරීමට එකග වෙමින් ගරු සභාපතිතුමා කරන ලද යෝජනාව ගරු උප සභාපති වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00 ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

රු. 10,000.00 ට වැඩි ගෙවීම් සියල්ල ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදි.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

**08:01 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ ඉතිරිවන අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා උදුනක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව.**

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ පොහොර අංගනයේ ඉතිරිවන අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා වියදම් ඇස්තමේන්තුව ලෙස රු.1,118,665 ක් පමණ වැය වන බවත්, ඒ සඳහා වැය වන මුදල පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාගැනීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලද අතර ඒ සඳහා අනුමැතිය ලබාදීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ සම්මත කරන ලදී.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

**09:01 HF 8952** දරන ට්‍රැක්ටරයට ටයර් දෙකක් ලබා ගැනීම සඳහා මිල ගණන්.

HF 8952 දරන ට්‍රැක්ටරයට ටයර් දෙකක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇති බවත් එහිදී අවම මිල ගණන් ලෙස ලැබී ඇති රු.119,000 යටතේ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:

මෙවර මහා සභාවට යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

මෙවර සභාවාරය සඳහා යෝජනා ඉදිරිපත් කර නොතිබුණි.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 පුස්තකාල උපදේශක කමිටු වාර්තාව

2014.09.19 වන දින පැවති **පුස්තකාල උපදේශක** කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 2014 අගෝස්තු මාසය සඳහා වන ලැබීම් හා ගෙවීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 10,796,556.75 |
| වෙනත් ලැබීම් | 616,597.79 |
| මුළු ලැබීම් | 17,413,154.54 |
| පුනරාවර්තන වියදම් | 6,729,681.55 |
| වෙනත් වියදම් | 11,875,348.55 |
| මුළු වියදම් | 18,605,030.10 |

ඉහත වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් ඉදිරිපත් නොවූයෙන් මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:02 2014.08.01 සිට 2014.08.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව

2014.08.01 සිට 2014.08.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 575,912.40 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී මමීක්ෂා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, එය මහ සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

### 14:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා.

කර්මාන්ත ප්‍රගතියේදි සඳහන් කල පරිදි තුඹගොඩ වසමේ පාරවල් පිළිසකර කර දීම සම්බන්ධයෙන් ගරු සභාවට ස්තුතිවන්ත වන බව පැවසූ ගරු උප සභාපතිතුමා,එමගින් එහි ජීවත්වන මිනිසුන් තමන්ට අඩු සැලකිල්ලක් දැක්වූවා යැයි සිතූ ආකල්පය පහව ගිය බවත් , තව දුරටත් අබලන් තත්වයේ පවතින සුනන්දාරාම මාවත පිළසකර කර දී එහි ජනතාවට ද සාධාරණයක් ඉෂ්ට කර දෙන ලෙසත් වැඩි දුරටත් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම පසුගිය දිනක බලංගොඩ තානායමේ එකම දිනක මඟුල් උත්සව 2ක් පැවැත්වීමට සිදුවු බවත්, එවන් අතපසු වීම් ඉදිරියේ දී සිදු නොවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරින් දැනුවත් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව සඳහන් කරන ලදී. වැඩි දුරටත් අදහස් දක්වමින් ,අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව යටතේ පෙර යුගවල නොවූ විරූ පරිදි සීඝ්‍ර යටිතල පහසුකම් සංවර්ධනයක් සිදුවන බවත්, අයවැය යෝජනා යටතේ විශාල වශයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සතුටට කරුණක් බවත් 2015 දි වෙන්වන යම් මුදල් ප්‍රමාණයක් ඇත්නම් එතුමාට ලැබීමට නියමිත මුදල පසුකලෙක අඩු කර ගැනීමේ පදනමින් මේ දිනවල ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී. එමගින් වැවේවත්ත ලයින් කාමරවල පුල්ලෙමඩුව සඳහා අඩුපාඩුවක්ව පවතින වැසිකිළියක් හා ඔවුන්ගේ උසු ජල ගැටළුවට පිළියමක් ලෙස සකස්කරනු ලබන ළිං සඳහා ළිං වළලු 2ක බැගින් ලබා දීමට කටයුතු කරන බව ගරු උප සභාපතිතුමා විසින් මෙහිදී සභාව වෙත අදහස් දක්වන ලදී.

එමෙන්ම සාධාරණ හේතූන් මත මන්ත්‍රීවරයෙකුට සභාවට වාර්තා කිරීමට නොහැකි වන අවස්ථාවකදී රජය මගින් මන්ත්‍රි දීමනාව කප්පාදු කිරීම පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කරන බව පැවසූ ගරු උප සභාපතිතුමා ඒ සඳහා සාධාරණයක් කර දෙන ලෙසට මෙහිදී දන්වා සිටින ලදී.

### 14:02 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

ඌව ජයග්‍රහණය කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයක් බවත්, එතුමාට ගෞරවණීය ප්‍රණාමය පුදකිරිමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ,ජයග්‍රහණය සඳහා කැප වූ සියළුදෙනාට ඌව ජනතාව වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත්, ගරු මන්ත්‍රිතුමා විසින් මෙහිදී පවසන ලදී.

එමෙන්ම කිරිදිගල මැද පාරේ නිවෙස් මගින් බැහැර කරන අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ඩීසල් පියාජියෝ ත්‍රීවිල් රථයක් සේවයේ යෙදවීමට යෝජනා කල ගරු මන්ත්‍රිතුමා තව දුරටත් අදහස් දක්වමින් පවසා සිටියේ,නගර සභා සීමාවට අයත් කුඩා අතුරු පාරවල් සඳහා ට්‍රැක්ටර් රථ යාමට නොහැකි යැයි පවසමින් සේවා සැපයීම පැහැර හැරිය නොහැකි බවත්, ට්‍රැක්ටර් නඩත්තුව සඳහා විශාල වියදමක් යන බැවින් හා එක් පුද්ගලයෙකු පමනක් යොදාගෙන මෙහි සේවය සැපයිය හැකි බැවින් මෙසේ පියාජියෝ ත්‍රීවිල් රථවල සේවය

අතුරු මාවත් සඳහා යොදා ගැනීම සුදුසු බවයි. මෙහිදී මෙම යෝජනාව සඳහා සභාවේ සියළුදෙනා එකගතාවය පළකරන ලදී.

එමෙන්ම බැංකියවත්ත සන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය පිළිස්සීම සඳහා යෝජිත නව තාක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නංවා බැංකියවත්ත ජනතාවට ජීවත්වීමට සුදුසු පරිසරයක් ගොඩ නගා දිය යුතු බව පැවසූ ගරු මන්ත්‍රීතුමා මහජන බැංකුව අසළ කාණුව ආශ්‍රිතව පිරිසිදු කිරීම් කර නොමැති හෙයින් මදුරුවන් බෝවීම සිදුවිය හැකි නිසා එය පිරිසිදු කර දෙන ලෙසත්, ගඟ ආශ්‍රිත නිවෙස් මඟින් ගඟට බට දමා අපද්‍රව්‍ය බැහැර කරන නිසා ඒ පිළිබඳව පරීක්ෂා කර බලා කඩිනම් පියවරක් ගන්නා ලෙසත් වැඩි දුරටත් පවසන ලදී.

### 14:03 නගර සභා ගරු මන්ත්‍රීඑම්. ජේ. මලික්ෂා මැතිතුමා

නගර සභා සීමාව තුළ පලීල් හාජියාර් මාවතේ ජල ටැංකිය අතුරු මාවත පස් පිරී අබලන් තත්වයේ පවතින බවත්, එය පිළිසකර කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් මෙහිදී අදහස් දක්වමින් ගරු මන්ත්‍රීතුමා විසින් පවසන ලදී.

ඌව පළාත් සභා ඡන්දය පිළිබඳ අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා මෙවර සුළු ජාතික ජනතාවගේ ඡන්ද රජයට අහිමි වූ බවත්, ජයග්‍රහණය විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස අර්ථ දැක්වීම සුදුසු නොවන බවත් පැවසීය.තවදුරටත් ජාතිවාදි හා අන්තවාදි පක්ෂවලට තම අරමුණු ඉටු කර ගැනීමට ඉඩ නොදෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා,එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක ලෙස පත්වූ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට සුභ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවද පවසන ලදී.

### 14:04 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා

නගර සභාවේ සේවයෙහි නියුතු විදුලි කාර්මිකවරයාට හැකි නම් රක්ෂණාවරණයක් ලබාදෙන ලෙස පැවසූ ගරු මන්ත්‍රීතුමා නගර අලංකරණය සඳහා පෝස්ටර්,කටවුට් ඉවත්කිරීමේ වැඩසටහන ඔස්සේ එක්සත් ජාතික පක්ෂයේ පෝස්ටර්,කටවුට් පමණක් ඉවත් නොකරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

වැඩි දුරටත් අදහස් දක්වමින් ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ කාලයත් සමඟ මිනිසුන්ගේ අවශ්‍යතා යාවත්කාලීන වන බවත් ,මහජනතාවගේ ඡන්දයෙන් පත්වන්නන් ලෙස ඒවා ඉටුකර දීම සෑම ජනතා නියෝජිතයෙකුගේම යුතුකමක් බවත් ,අතීතයේ සිට මේ දක්වා පාලනයේ නිරත සියළු නගර සභා නියෝජිතයන් නගරයේ යහපත උදෙසා ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස යහපත් නගරයක් ලැබී ඇති බවත්ය.

උඩ ඇල්ලෙපොළ නාන ළිඳ පිළිබඳව ඇති ප්‍රශ්නය කඩිනමින් නිමා කර දෙන ලෙස ඉල්ලූ ගරු මන්ත්‍රීතුමා, නිදහස් පරිසරයක ජීවත්වීමේ අයිතිය රටට පෙන්වා දි එක්සත් ජාතික පක්ෂයට පක්ෂපාතිව ක්‍රියාකල ඌව ජනතාවට බලංගොඩ නගර සභාවේ විපක්ෂ කණ්ඩායම වෙනුවෙන් ස්තූතිය පළ කළ අතර, එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක ලෙස පත්වූ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට සුභ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවද පවසන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති ඩබ්ලිව්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

මෙහිදී ඌව ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලද්දේ සියළු විපක්ෂ එක් වී රජයට එරෙහිව අභියෝග කල නමුත් රජයේ ජයග්‍රහණය නතර කිරීමට කිසිවෙකුට නොහැකි බවත්, අතිගරු ජනාධිපතිතුමා මේ වන විට රටේ නායකයා පමණක් නොව ලෝකයේ නායකයෙක් ලෙස ජනප්‍රිය වී ඇති බවත්, එතුමාගේ සංවර්ධන කාර්යයන්හි ප්‍රතිලාභ පොදුවේ සියළු දෙනාටම ලැබේවායි ප්‍රාර්ථනා කරන බවත් පැවසූ ගරු සභාපතිතුමා අවසාන වශයෙන් අදහස් දක්වමින් ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන රටක් ලෙස මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා සහයෝගයෙන් කටයුතු කිරීමට කැපවිය යුතු බව දන්වමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ කටයුතු ප. ව. 2.00 ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.